৺

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1944/47 - 2015 දෙසැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2015.12.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක 36.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය මගින් සලසා ඇති විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකරමින් කිසිදු නිෂ්පාදකයකු වෙළෙන්දකු හෝ බෙදාහරින්නකු විසින් පහත දක්වා ඇති අයිතමය එහි සඳහන් උපරිම සිල්ලර මිලට වඩා ඉහළ මිලකට අලෙවි කිරීම, අලෙවිය පිණිස තැබීම හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම සිදු නොකළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් නියෝග කරනු ලැබේ.

| | |
|---|---|
| | *කිලෝ ග්‍රෑම් 1 ක උපරිම සිල්ලර මිල* |
| අධි ශීතකළ හෝ ශීතකළ සම රහිත බ්‍රොයිලර් කුකුළු මස් (සම්පූර්ණ කුකුළා) | රු. 480/- |

මෙම නියෝගය 2015 දෙසැම්බර් මස 10 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

හසිත තිලකරත්න,
*වැඩබලන සභාපති.*

2015 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

12 - 899/1

1A - PG 2724 — 206 (2015/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නියෝග අංක 37.

## 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

### 20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියාකරමින් 2015 නොවැම්බර් මස 24 දිනැති අංක 1942/14 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 35 මගින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පහත දක්වා ඇති භාණ්ඩ සඳහා උපරිම සිල්ලර මිලක් නියම කරන ලදී.

| *නිෂ්පාදනය* | *උපරිම සිල්ලර මිල* |
|---|---|
| වියළි හාල් මැස්සන් | කි.ග්‍රෑ. 1 ක් සඳහා රු. 410.00 - (බහාලුම් රහිත) |
| පරිප්පු | කි.ග්‍රෑ. 1 ක් සඳහා රු. 169.00 - (බහාලුම් රහිත) |
| ''කට්ටා'' කරවල | කි.ග්‍රෑ. 1 ක් සඳහා රු. 1,100.00 - (බහාලුම් රහිත) |
| ''සාලයා'' කරවල | කි.ග්‍රෑ. 1 ක් සඳහා රු. 425.00 - (බහාලුම් රහිත) |
| කඩල | කි.ග්‍රෑ. 1 ක් සඳහා රු. 169.00 - (බහාලුම් රහිත) |

ඉහත භාණ්ඩ නිෂ්පාදකයින්, ආනයනකරුවන්, අසුරන්නන්, බෙදාහරින්නන් හෝ වෙළෙඳුන් විසින්, එම භාණ්ඩ ඇසුරුම්/බහාලුම් වල අසුරා විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම කරනු ලබන්නේ නම් එවිට අදාළ ඇසුරුම් කළ/බහාලුම් කරන ලද භාණ්ඩ සඳහා භාණ්ඩයේ බර නොසලකා වැඩිමනත් වශයෙන් රු.5/- කට නොවැඩි මුදලක් එකතු කළ හැකි බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ඉහත පනතේ 20(5) වන වගන්තිය ප්‍රකාරව මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියෝගය 2015 දෙසැම්බර් මස 10 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

හසිත තිලකරත්න,
*වැඩබලන සභාපති.*

2015 දෙසැම්බර් මස 10 වැනි දින.
කොළඹ දී ය.

12 - 899/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.